**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2020**

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.
මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන වලින් වියදම් කරන ලද එකතුව රු.2,627,721,241 ක මුදල ප්‍රාග්ධන ප්‍රදාන වියදම් ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. තවද සමුච්චිත අරමුදල් ගිණුමේ පැවති වියදම් කල ප්‍රාග්ධන ප්‍රදාන වාර්ෂිකව ක්‍රමක්ෂය නොකිරීම හේතුවෙන් රු.755,984,051 කින් පොදු සංචිත ගිණුම අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු.109,007,627 ක් වූ ක්‍රමක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් ගිණුම් ගත කිරීමේදී විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම සඳහා ලබාදෙන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන , සමුච්චිත අරමුදලට මාරු කිරීම හා වාර්ෂිකව වත්කම් අත් කර ගැනීම වෙනුවෙන් ලබාදෙන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම 2012 වර්ෂයේ සිට සිදු කර ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,594,333ක්වූ වියදම් නොකළ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිමිකම් යටතේ දැක්වීම වෙනුවට, ජංගම වගකීම් යටතේ දක්වා තිබීමෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වියදම් නොකල රජයේ ප්‍රාග්ධන ප්‍රදාන, මූල්‍ය ප්‍රකාශයේ හිමිකම් යටතේ හෙළිදරව් කිරීමට ඉදිරියෙදි කටයුතු කරනු ලැබේ. | හිමිකම් හා වගකීම් නිවැරදි වර්ගීකරණයන් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ රු. 870,272,961 ක් වූ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ දැක්වීම වෙනුවට ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත ආදායම් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුල විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන ඇති රජයේ ප්‍රාග්ධන ප්‍රදාන “හිමිකම්” යටතේ හෙළිදරවු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | හිමිකම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නියමිත වර්ගීකරණයන් යටතේ දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) ගොඩනැගිලි වලට අදාළව ඉකුත් වර්ෂයකදී සිදු වූ වරදක් නිවැරදි කිරීමේ දී ක්ෂය වෙන්කිරීමේ ගිණුමෙන් රු.392,051 ක් පමණක් ඉවත් කිරීම වෙනුවට දෝෂ සහගත ලෙස රු.1,474,857 ක් ඉවත් කිරීම හේතුවෙන් ගොඩනැගිලිවල ශුද්ධ වටිනාකම රු.1,082,806 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එම දෝෂය ක්ෂය වෙන්කිරීමේ ගිණුමෙන් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | වැරදි නිවැරදි කිරීමේදී නැවතත් දෝෂ ඇති නොවන අයුරින් නිවැරදි වටිනාකම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අතරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු.30,097,147 ක් වූ තැන්පතු 31 ක් නියාදනය කර නොතිබුණි. | අවසන් බිල්පත් නිරවුල් වූ පසුව නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය** | | | |
| (i) V පරිච්ඡේදයේ 7.6 ඡේදය | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ආචාර්යවරු 06 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,577,658 ක මුදලක් විශ්වවිද්‍යාලයට අයවිය යුතුව තිබුණි. | ආචාර්යවරු 05 දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.13,266,150 ක් මෙ දක්වා අයකරගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | බැඳුම්කර ගිවිසුම් කඩ කිරීමට අදාලව අයවිය යුතු මුදල් අය කර ගැනීමට කඩිනමින්ම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) VII පරිච්ඡේදයේ 4.1 ඡේදය | 2017 ජනවාරි 01 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ 390 දෙනෙකු වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හෝ භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු.40,580,180 ක් ගෙවා තිබුණි. | 2017 වසර තෙක් විශ්වවිද්‍යාලය මඟින් කුළියට ගනු ලැබූ විශ්වවිද්‍යාලය අවට ඇති නිවාස කාර්යමණ්ඩල නේවාසිකාගාර ලෙස භාවිතා කල අතර එහිදී කාර්යමණ්ඩල සංඛ්‍යාව විශාල වීම මත නේවාසිකාගාර පහසුකම් ලබාදීම සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් දැනට පවතින නිවාස කුලිය ගෙවීම මඟින් කාර්යමණ්ඩල සුභසාධනය සිදු කරන ලදී. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතුය. |
| (ඇ) **2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** **-------------------------** | | | |
| (i) 9.1 ඡේදය | (i) තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික තත්ත්වයේ නිළධාරීන්ට පමණක් ලබාදිය හැකි වුව ද ඊට අනුකූල නොවන ලෙස අවස්ථා 87 කදී මාණ්ඩලික නොවන නිළධාරීන්ට එකතුව රු.1,805,054 ක අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | අදාල අංශ ප්‍රධානි හෝ මාණ්ඩලික නිලධාරින් එකවර විශේෂිත කාර්යයන් කිහිපයක් සිදු කිරීමේදී එම මාණ්ඩලික නිළධාරීන්ට එකවර අතුරු අග්‍රිම කිහිපයක් ගෙවීම වැලැක්වීම සඳහා එසේ සිදු කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද අවස්ථා 116 කදී ලබාගත් එකතුව රු.1,585,563 ක් වූ අතුරු අග්‍රිමයන්ගෙන් ඉතිරි වී පියවා තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට | අවශ්‍ය වන මුදලට සරිලන ඇස්තමේන්තු සකසන ලෙස කාර්යය මණ්ඩලයට උපදෙස් ලබා දී ඇති අතර ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු වලට අනුව අතුරු අග්‍රිම නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොදිය යුතු ය. |

සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 180,829,830 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 174,635,769 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,194,061 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක වැටුප් හා වේතන වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ශිෂ්‍ය කාර්යසාධනය

----------------------

**(අ) සිසුන් බඳවා ගැනීම**

---------------------

2017/2018 හා 2018/2019 අධ්‍යයන වර්ෂයේ දී විශ්වවිද්‍යාලය වෙත නවක සිසුන් ලෙස 862 දෙනෙකු බැගින් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, සත්‍ය ලෙස සිසුන් 764 දෙනෙකු හා 791 දෙනෙකු පමණක් බඳවා ගැනීමෙන් සිසුන් 169 දෙනෙකු ඉකුත් හා ප්‍රවර්ථන වර්ෂයේදී සැලසුම් කළ පරිදි බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව පුරප්පාඩු පැවතියදී සිසුන් 169 දෙනෙකුට විශ්වවිද්‍යාල ප්‍රෙවිශය අහිමි වී තිබුණි.

**(ආ) කුලී නේවාසිකාගාර**

----------------------

විශ්වවිද්‍යාලය විසින් 2020 වර්ෂයේදී සිසුන් 1251 ක් වෙනුවෙන් කුලී නේවාසිකාගාර 46 ක් සඳහා රු.52,883,400 ක් වැයකර තිබුණු අතර, ඊට සාපේක්ෂව 2019 වර්ෂයේදී සිසුන් 952 ක් වෙනුවෙන් කුලී නේවාසිකාගාර 38 ක් සඳහා රු.36,648,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද ප්‍රවර්ථන වර්ෂයේ මාර්තු මාසයෙන් පසුව කොවිඩ් 19 වසන්ගතය පැතිරීම මත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු නතර කර තිබුණු අතර ඉන්පසු එකදු ශිෂ්‍යයෙක් හෝ නේවාසිකව නොසිටිය දී ප්‍රවර්ථන වර්ෂයේදී, ඉකුත් වර්ෂයට සාපේක්ෂව කුලී නේවාසිකාගාර සඳහා රු.16,235,400 ක් අතිරේකව වියදම් දැරීම සඳහා ගිවිසුම් ගත වීම ප්‍රශ්න සහගත විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 පෙබරවාරි 10 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාලය ස්ථාපනය කිරීම සඳහා ලබා දීමට නියමිතව තිබුණු කර්මාන්ත අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 29.805 ක ඉඩම වසර 16 ක කාලයක් ගතවී ඇතත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම පවරාගෙන නොතිබුණි. එහෙත් මෙම ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන ඉඩම් අත්පත් කර ගැනීමේ උපදේශක තනතුරට 2017 දෙසැම්බර් 06 දින සිට විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මාසික වේතන ලෙස එකතුව වූ රු.1,850,000 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් වලට අනුකූලව, විශ්වවිද්‍යාල වෙත සුදුසු නිළධාරියකු ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා පත් කරගන්නා ලෙස දන්වා ඇත. ඒ අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 126 වෙනි පාලක සභාවේ අනුමැතිය මත විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු, උපදේශන සේවාව ලබා ගැනීමේ පදනම මත බඳවා ගන්නා ලදී. එසේම ඔහුට පැවරෙන රාජකාරි මත හා අදාල කටයුතු වාර්තා කිරීම වෙනුවෙන් රු.50,000 ක මාසික ගෙවීමක් සිදු කිරීම සඳහා පාලක සභාවේ අනුමැතිය මත ඔහුගෙන් ලබා ගන්නා මාසික වාර්තාව මත ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. | විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් කඩිනමින් පවරාගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුට චීනයේ සියාමන් විශ්වවිද්‍යාලයේ (Xiamen University) දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා 2015 සැප්තැම්බර් 25 සිට 2018 සැප්තැම්බර් 24 දක්වා වසර 03 ක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ද වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අවසන් වන දින සිට 2019 ජුලි 24 දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ද අනුමත කර තිබුණි. එහෙත් එම ආචාර්යවරයා දර්ශනපති උපාධිය සම්පූර්ණ නොකර 2019 ජුලි 11 දින සේවයට වාර්තා කර තිබුණි. 2021 ඔක්තෝබර් වන විට වසර 02 කට අධික කාලයක් දර්ශනපති උපාධිය සම්පූර්ණ කර නොතිබුණද බැඳුම්කර ගිවිසුම් උල්ලංගනය කිරීම සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | ආචාර්ය උපාධිය නිම කිරීමේ සහතිකය භාර දීමට 2021 දෙසැම්බර් මස දක්වා කල් ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබූ අතර එම ඉල්ලීම බැඳුම්කර අයකරගැනීමේ සමාලෝචන කමිටුව වෙතද යොමු කල අතර අදාල වාර්තාව සලකා බලා 2021 ජූනි මස 30 වනදා තෙක් ආචාර්ය උපාධි සහතිකය විශ්වවිද්‍යාලය වෙත භාරදීමට කල් ලබා දීමට තීරණය කරන ලද අතර එම දිනය වන විටත් එය භාරදීමට නොහැකි වුවහොත් බැඳුම්කර උල්ලංගනය කල පුද්ගලයෙකු ලෙස සලකා කටයුතු කිරීමට තීරණය කරන ලදී. | නියමිත කාලය තුල ආචාර්ය උපාධිය සම්පූර්ණ නොකර බැඳුම්කර ගිවිසුම් කඩකළ නිළධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 ජූනි 09 දින ඇස්තමේන්තුගත පිරිවැය රු.253,219,360 කට (එකතු කළ අගය මත බදු රහිත) ගිවිසුම් ගතව ඉදිකිරීම් ආරම්භ කර 2019 ජූනි 29 දිනට පෙර නිම කිරීමට නියමිතව තිබූ තාක්ෂණික පීඨ ගොඩනැගිල්ල නියමිත කාලය තුල නිමකිරීමට නොහැකි වූයෙන් අවස්ථා 06 කදී විවිධ හේතු මත කොන්ත්‍රාත් කාලය 2021 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අතිරේක වැඩ වටිනාකම රු.15,543,225 ක් ද ඇතුළුව රු.216,258,984 ක පිරිවැයක් දරා තිබුණ ද ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීමට අපොහොසත් වී තිබුණි. | කර්මාන්තයේ ඉදිකිරීම් මේ වන විට අවසන් අදියරට පැමිණ ඇති අතර භෞතික ප්‍රගතිය 87% ක් වේ. මූල්‍ය ප්‍රගතිය 80% වන අතර තවදුරටත් නිමකළ යුතු වැඩ වල වටිනාකම රුපියල් මිලියන 52කි. අදාල ඉදිකිරීම් ආයතනය රාජ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන බැවින් හා පවතින COVID -19 වසංගතය සහ ආනයන සීමා කිරීම් වැනි තත්වයන් හමුවේ මෙම ආයතනයට භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ දුෂ්කරතාවන් පවතින බව නිරීක්ෂණය විය. | ගිවිසුම්ගත කාලය තුල අදාල ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අවශ්‍ය අධීක්ෂණ හා මග පෙන්වීම් ලබා දීමටත් කොන්ත්‍රාත්කරු ගේ පාලනයෙන් බැහැර කරුණු සඳහා පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2019 අප්‍රේල් 02 දින සේවයෙන් විශ්‍රාම ගොස් තිබුණු නිළධාරිනියක් සඳහා ගෙවිය යුතු පාරිතෝෂික මුදල නිසි ලෙස ගණනය කර 2019 මැයි 02 දිනට පෙර නොගෙවීම හේතුවෙන් අධිභාර ලෙස රු.206,119 ක් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරන සහකාර තනතුරේ සේවය කර විශ්‍රාම ගන්නා ලද ප්‍රථම අනධ්‍යයන නිළධාරිනිය ඇය වන අතර දැනට විශ්‍රාම යාමට නියමිත සේවකයින් සඳහා පාරිතෝෂිකය, විශ්‍රාම යන දිනටම ලබාදීමට අදාල කටයුතු සිදු කිරීම පිළිබඳ අදාල අංශ දැනුවත් කොට ඇති අතර විශ්‍රාම යෑමට නියමිත සේවකයින් සිටීනම් ඒ පිළිබඳ කලින් දැනුවත් කිරීමක් වැටුප් අංශයට හා ගෙවීම් අංශයට සිදු කොට අදාල පාරිතෝෂික මුදල කලින් වෙන්කර තබා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. | පාරිතෝෂික මුදල් නියමිත කාලය තුල ගෙවීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාද හේතුවෙන් විශ්වවිද්‍යාලයට ගෙවීමට සිදුවූ අධිභාර පිළිබඳ පරික්ෂා කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.3,625,120 ක ණය හිමි ශේෂ 05 ක් වසර 01 සිට වසර 04 දක්වා කාලයක් ගතවී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ හා සේවා සැපයීම සම්පූර්ණ නොකිරීම, බිල්පත් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් වැනි හේතු නිසා වසර කිහිපක් පැරණි සැපයුම්කරුවන් 05 දෙනෙකුගේ ශේෂයන් 2020.12.31 දිනට ණයහිමි ශේෂයේ ඇතුලත්ව තිබුණි. | භාණ්ඩ හා සේවා නියමිත පිළිවිතරයන්ට සැපයීමෙන් පසු කඩිනමින් ගෙවීම් සිදු කිරීමට පියවර ගත යුතුය. |

**3.3 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ජීව විද්‍යාගාරය සඳහා 2016 වර්ෂයේදී රු.2,536,382 කට මිලදී ගෙන තිබුණු වර්ග 08 කට අයත් වීදුරු ද්‍රව්‍ය (Glassware) ඒකක 70 ක් වසර 04 කට අධික කාලයක සිටද, උසස් අධ්‍යාපන ව්‍යාප්ත කිරීමේ හා සංවර්ධනය කිරීමේ වැඩසටහන් කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ රු.10,741,101 කට මිලදී ගත් උපකරණ 04 ක් වසරකට අධික කාලයක සිටද මිලදී ගත් කාර්ය සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2016 වර්ෂයේ දී Science and Technology හා Mineral Resources and Technology යන උපාධි පාඨමාලාවන්හි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට අපේක්ෂාවෙන් මිලදී ගන්නා ලදී.<br>2016 වර්ෂයේ විෂයමාලා සංශෝධනයෙන් පසුව ඉහත සඳහන් උපාධි පාඨමාලාවන්හි ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනස් වීම හේතු කොට ගෙන වීදුරු භාණ්ඩ වල භාවිතය වෙනස් වීම මෙම තොග ඌන උපයෝජනයට හේතු විය. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන භාණ්ඩ මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 86 ක් හා අනධ්‍යන කාර්යමණ්ඩලයේ 43 ක් පුරප්පාඩු පැවතුණි. | 2020.12.31 දින වන විට ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 86 ක් තිබුණද ඉන් අනුමත පුරප්පාඩු 43 ක් සඳහා අනුමැතිය 2020.11.19 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිපිය මගින් විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත. අධ්‍යයන හා | අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල අත්‍යවශය පුරප්පාඩු පමණක් පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා 2021 පුවත්පත් දැන්වීම් පල කොට අයදුම්පත් කැඳවා ඇත. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී, සහකාර ලේඛකාධිකාරී තනතුරු පුරප්පාඩු පුරවනු ලබනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟිනි. තවද පහළ ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නවතා දමන ලෙස දැනුවත් කිරීම් සිදු කොට ඇත. | |
| (ආ) | 2010 අප්‍රේල් 23 දිනැති හා අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා විවෘත බඳවා ගැනීමේදී, එම තනතුරට අදාල සුදුසුකම් සපුරා නොතිබූ අයදුම්කරුවකු 2018 ජුලි 25 දිනැති වැඩබලන උපකුලපතිවරයාගේ ලිපිය මගින් අවිධිමත් ලෙස බඳවාගෙන 2018 අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ ජුලි දක්වා වූ කාලය සඳහා රු.5,418,552 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුරට බඳවා ගැනීමේදී 2010 අප්‍රේල් 23 දිනැති අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව පසු සුදුසුකම් සලකා බැලීමෙන් අදාල අයදුම්කාරිය බඳවා ගැනීම සිදුවන අවස්ථාවේ දර්ශනපති උපාධිය සම්පූර්ණ කොට තිබීම පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුරට බඳවා ගන්නා ලදි. එමෙන්ම මේ වන විට සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි අදාල විශ්වවිද්‍යාල වෙත යොමු කොට ඇති බවද දන්වා සිටිමි. | තනතුරට අදාල සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විධිමත්ව බඳවා ගැනීම සිදු කළ යුතුය. |